**<u>බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනයන්හි</u>**

**<u>ඖෂධවේදී විශේෂ ශ්‍රේණියේ තනතුරට පත්කිරීම</u>**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ රෝග නිවාරණ දෙපාර්තමේන්තුවේ ඖෂධවේදී විශේෂ ශ්‍රේණියේ තනතුරට පත්කිරීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

02. බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් **1999.02.02** දිනැතිව අනුමත කරන ලද <u>"බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ඖෂධවේදී බඳවාගැනීමේ හා උසස්කිරීමේ පරිපාටිය"</u>ට හා බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමිය විසින් **2020.01.14** දිනැතිව අනුමත කරන ලද <u>"බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ඖෂධවේදී බඳවාගැනීමේ හා උසස්කිරීමේ පරිපාටියේ විශේෂ ශ්‍රේණියට උසස්වීම් ලබාදීම සඳහා ජ්‍යෙෂ්ඨත්වය හා කුසලතාවය මත ලකුණු ලබාදීමේ පොදු ක්‍රමවේදය"</u> අනුව ඖෂධවේදී I පන්තියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවීමෙන් අනතුරුව අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට භාජනය කර පහත නිර්ණායක යටතේ ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව පුරප්පාඩු පිරවීම සිදු කරනු ලැබේ.

**<u>නිර්නායක:</u>**

I. **ජ්‍යෙෂ්ඨත්වය - උපරිම ලකුණු 18**
   a) ඖෂධවේදී I ශ්‍රේණියේ සෑම වසරකට ලකුණු 02 බැගින්

II. **අතිරේක සුදුසුකම් - උපරිම ලකුණු 62**
   a) පිළිගත් විශ්ව විද්‍යාලයක් මඟින් ලබාගත් උපාධියක් (ලකුණු 10)
   b) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ඩිප්ලෝමාවක් හෝ ඖෂධවේදය පිළිබඳ උසස් පාඨමාලාවක් හදාරා තිබීම (ලකුණු 04)
   c) ඖෂධවේදයට අදාල විෂයානුබද්ධ පාඨමාලා (කාලය සති 02 කට වැඩි) එකකට ලකුණු 02 බැගින් (උපරිම ලකුණු 04)
   d) අ.පො.ස. (උ/පෙළ) විද්‍යා විෂය ධාරාවට අයත් විෂයයන් ජීව විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව යන විෂයයන් 03 ක් සමත්වීම (උපරිම ලකුණු 12)
      - විශිෂ්ඨ සම්මාන - 04
      - අධි සම්මාන - 03
      - සම්මාන සාමාර්ථය - 02
      - සාමාන්‍ය සාමාර්ථය - 01

   e) අ.පො.ස. (සා/පෙළ) ඉංග්‍රීසි භාෂාව සමත්වීම (ලකුණු 04)
      - විශිෂ්ඨ සම්මාන - 04
      - අධි සම්මාන - 03
      - සම්මාන සාමාර්ථය - 02
      - සාමාන්‍ය සාමාර්ථය - 01

   f) ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය පිළිබඳ පාඨමාලාවක් හදාරා තිබීම (ලකුණු 04)
   g) ගබඩාකරණය පිළිබඳ පාඨමාලාවක් හදාරා තිබීම (ලකුණු 04)
   h) පරිගණක පාඨමාලාවක් හදාරා තිබීම (මාස 03 කට වැඩි) (ලකුණු 02)
   i) පූර්වාසන්න වසර 03 හි කාර්ය සාධන ඇගයීම (උපරිම ලකුණු 18)
      - ඉතා හොඳයි - 04
      - හොඳයි - 03
      - සතුටුදායකයි - 02

III. **විශේෂ කුසලතා - උපරිම ලකුණු 05**
   a) විෂයානුබද්ධ නොවන විශේෂ දක්ෂතා (ලකුණු 05)
   උදා - ක්‍රීඩා / කලා/ සමාජීය/ ආගමික/ තොරතුරු තාක්ෂණය

IV. **පළපුරුද්ද - උපරිම ලකුණු 15**
   a) ඖෂධවේදී විශේෂ ශ්‍රේණියේ වැඩ බලන ලද සෑම වසරකට ලකුණු 02 බැගින් (උපරිම ලකුණු 10)
   b) සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාව (ලකුණු 05)

03. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව මෙම තනතුරට අදාල මාසික වැටුප් පරිමාණය
රු. 50,200 - 10 x 1345 - 8 x 1630 – 76,690 (MT - 8 - 2016 )
සටහන : අංක 03/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන II හි සඳහන් පරිදි ගෙවීම් කරනු ලැබේ.

04. මෙම නිවේදනයට යා කර ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව A4 ප්‍රමාණයේ (සෙ.මී. 21x29) කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අපේක්ෂකයා විසින්ම නිවැරදිව හා පැහැදිළිව අයදුම්පත සකස් කරගත යුතුය.

05. සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2020.07.31 දිනට පෙර තම ආයතන ප්‍රධානියා, පළාත් පාලන කොමසාරිස් (බ.ප.), පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් (බ.ප.) හා ප්‍රධාන ලේකම් (බ.ප.) මඟින්, නිර්දේශ සහිතව **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව - බස්නාහිර පළාත, අංක 628, 10 වන මහල, ජන ජය සිටි ගොඩනැඟිල්ල, නාවල පාර, රාජගිරිය"** යන ලිපිනයට එවිය යුතුය. නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා නොමැති හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිඳු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

06. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2020.07.31 වේ.

07. අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාල කරුණු හෝ එම නිවේදනයෙන් ආවරණය නොවන වෙනත් කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වේ.

දිනය - 2020.

තිලක් සෙනරත්
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත

**<u>ආදර්ශ අයදුම්පත්‍රය</u>**

**<u>බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනයන්හි</u>**

**<u>ඖෂධවේදී විශේෂ ශ්‍රේණියේ තනතුරට පත්කිරීම</u>**

1. <u>නිලධාරියා පිළිබඳ තොරතුරු</u>

1.1 මුලකුරු සමඟ නම : ...................................................................................

1.2 සම්පූර්ණ නම : ...................................................................................

..........................................................................................................................

1.3 හැඳුනුම්පත් අංකය : ...................................................................................

1.4 දැනට දරන තනතුර : ...................................................................................

1.3 සේවා ස්ථානය සහ එහි ලිපිනය : ...................................................................................

..........................................................................................................................

2. <u>පත්කිරීමට අදාල තොරතුරු</u>

2.1 ඖෂධවේදී I ශ්‍රේණියට පත්වූ දිනය : ..................................................................................

2.2 ඖෂධවේදී I ශ්‍රේණියට පත්කරන ලද උසස්කිරීම් ලිපියේ අංකය හා දිනය : ...............................

2.2 එම කාලය තුල සියළුම වැටුප් වර්ධක උපයාගෙන තිබේද ? ....................................................

2.3 අඩ වැටුප් සහිත නිවාඩු / වැටුප් රහිත නිවාඩු ලබා ගෙන ඇත්නම් ඒ පිළිබඳ විස්තර :

2.4 විනය දඬුවම් ලබා තිබේද? ඔව් / නැත

ලබා තිබේනම් ඒ පිළිබඳ විස්තර : ..................................................................................

2.5 ඖෂධවේදී විශේෂ ශ්‍රේණියේ වැඩබලා ඇත්නම් ඒ පිළිබඳ විස්තර : ..........................................

..........................................................................................................................

3. <u>අනෙකුත් සුදුසුකම්</u> (නිවේදනයේ නිර්නායක II යටතේ a,b,c,f,g,h සඳහා)

3.1 උපාධියක් ලබා තිබේනම් ;

3.1.1 ලබා ඇති උපාධිය : ..................................................................................

3.1.2 විශ්ව විද්‍යාලය : ..................................................................................

3.1.3 උපාධිය වලංගු දිනය : ..................................................................................

3.2 හදාරා ඇති ඩිප්ලෝමා හා ඖෂධවේදය පිළිබඳ පාඨමාලා සම්බන්ධයෙන් විස්තර;

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

3.3 ප්‍රසම්පාදන ක්‍රියාවලිය / ගබඩාකරණය / පරිගණක දැනුම පිළිබඳව හදාරා ඇති පාඨමාලා සම්බන්ධයෙන් විස්තර;

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

4. <u>විශේෂ කුසලතා</u> (නිවේදනයේ නිර්නායක III යටතේ)

4.1 විෂයානුබද්ධ නොවන විශේෂ දක්ෂතා සම්බන්ධයෙන් විස්තර :

.....................................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

5. <u>අයදුම්කරුගේ ප්‍රකාශය</u>

ඉහත සඳහන් සියළු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, මා හට විරුද්ධව නොනිමි විනය පරීක්ෂණයක් නොමැති බවත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ඖෂධවේදී විශේෂ ශ්‍රේණියේ තනතුරට පත්කිරීමට අදාළ සියලු සුදුසුකම් සපුරා ඇති බවත් සහතික කරමි.

දිනය : ............................... .............................................

නිලධරයාගේ අත්සන

6. <u>දෙපාර්තමේන්තු ප්‍රධානිගේ නිර්දේශය</u>

ඉහත සඳහන් සියළු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, ඉහත නම් සඳහන් ..................................................... මහතා / මිය / මෙනවිය බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ඖෂධවේදී විශේෂ ශ්‍රේණියේ තනතුරට පත්කිරීම සඳහා වූ සියළු කරුණු පෞද්ගලික ලිපි ගොනුව අනුව සම්පූර්ණ කර ඇති බවට සෑහීමකට පත්වෙමි. ඒ අනුව එම නිලධරයා අදාල තනතුරට පත්කිරීම නිර්දේශ කරමි.

අත්සන : .............................................................

නිල මුද්‍රාව : ........................................................

දිනය : ............................

7. <u>අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය</u>

දෙපාර්තමේන්තු ප්‍රධානී විසින් ඉහතින් දක්වා ඇති කරුණු නිවැරදි බවත් / නිවැරදි නොවන බවත්, ඒ අනුව ඉහත නිර්දේශ හා එකඟ වන බවත් / නොවන බවත් කාරුණිකව දන්වමි.

අත්සන : .............................................................

නිල මුද්‍රාව : ........................................................

දිනය : ............................

8. <u>ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය</u>

ඉහත නිර්දේශය හා එකඟ වෙමි / නොවෙමි.

.

අත්සන : .............................................................

නිල මුද්‍රාව : ........................................................

දිනය : ............................